**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය - 2013**

---------------------------------------------------------

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (SLSEA) 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳව ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශක

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි අධිකාරියෙන් පවරා ගත් අක්කර 50 ක භූමිභාගයක් සහිත ඉඩම සහ ඒ තුල ඉදිකර ඇති හම්බන්තොට සෝලා පාර්ක් ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේදී ද අගය කර මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ආ) සම්පූර්ණයෙන්ම විනාශ වූ සුළං කුලුණ ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් නොකිරීම හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන දේපල පිරියත හා උපකරණ වල වටිනාකම රු.2,377,000 කින් වැඩිපුර දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන වලට අනුව හම්බන්තොට බල ජනනයෙන් ලද ආදායම රු.36,355,017 කි. කෙසේ වුවද, විකුණුම් ඉන්වොයිස් වලට අනුව එය රු.44,153,180 වූයෙන් 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන ආදායම සහ ලැබිය යුතු දැ රු.7,798,163 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) පසුගිය වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ කර තිබුණද, ඒ බව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 03ට අනුව , ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි, හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබිය යුතු සහ ගෙවිය යුතු වටිනාකම් පිළිවෙලින් රු.15,872,896 සහ රු. 37,698,530 සම්බන්ධව වයස් විශ්ලේෂණ පිළියෙල කර නොතිබුණි. තවද එකී ශේෂයන් සම්බන්ධව 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ තහවුරු කිරීම් කැඳවා නොතිබුණි. එම නිසා මෙම ශේෂයන් ගේ නිරවද්‍යතාවය සහ විශ්වාසනීයත්වය පිළිබඳ තහවුරුවක් විගණනයේ දී ලබා ගැනීමට නොහැකි විය.

### 2.2.3 නොසැසඳුණු වෙනස්කම්

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වටිනාකම සහ විගණනයට ලබාදුන් විස්තරාත්මක උපලේඛනයේ දැක්වෙන වටිනාකම අතර රු. 13,624,445 ක වෙනසක් දක්නට ලැබුණි.

(ආ) සුනිත්‍ය බලශක්ති අරමුදල සහ සුනිත්‍ය බලශක්ති භාරකාර අරමුදලට අදාල ශේෂ ඊට අනුරූපී ආයෝජන වටිනාකම් දෙක අතර පිළිවෙලින් රු. 8,030,813 සහ රු.8,000,000 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

## 2.3 නීති,රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

---

විගණනයේදී හෙළිදරව් වූ නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරණ <u>මුදල් පනත</u> | | |
| | (i) | 8(1) වගන්තිය | 2012 සැප්තැම්බර් 30 දිනට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතු අධිකාරියේ 2013 වර්ෂය සඳහා වූ අයවැය 2013 ජනවාරි 16 දින අනුමත කර තිබුණි. |
| | (ii) | 14(1) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | <u>භාණ්ඩාගාර චක්‍රලේඛ</u> | | |
| | (i) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| | (ii) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/ 2002/02 දරන චක්‍රලේඛය | පරිගණකදෘඩාංග හා මෘදුකාංග සඳහාලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි අංක 396 | | රු. 459,910 වටිනා හිඟව ඇති චෙක්පත් පිළිබඳව නිසි පියවර ගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.44,490,201 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ රු.20,906,665 අතිරික්තයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.23,583,536 ක වර්ධනයක් දැක්වේ. පුනරාවර්තන ප්‍රදාන බලශක්ති බලපත්‍ර ගාස්තු සහ ඉන්දන බල උත්පාදනයෙන් (ඉඳුරාන) ලැබූ ආදායම රු.51,503,137 කින් වැඩිවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### 3.2.1 ප්‍රොටෝටයිප් විදුලි වාහන 3 ක් (prototype Electric Vehicles) සංවර්ධනය කිරීම

මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද පරිදි, ප්‍රොටෝටයිප් විදුලි වාහන තුනක් 2007 සැප්තැම්බර් 28 සිට මාස 18 ක් ඇතුළත සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 7.888 ක මුදලක් එනම් එකඟ වූ මිලෙන් සියයට 87.66 ක් 2009 දෙසැම්බර් 31 දිනට ගෙවා තිබුණි. විධිමත් කාල දීර්ඝ කිරීමක් නොමැති වූ ව්‍යාපෘති කාල පරිච්ඡේදය වර්ෂ 4 කට ආසන්න කාලයක් වැඩිපුර ඇදී ගොස් තිබුණද, විගණන පරීක්ෂණ දිනය වූ 2014 මැයි මාසය දක්වා ද එක් වාහනයක් හෝ නිම කිරීමට සංවර්ධකට නොහැකි වී තිබූ බව නිරීක්ෂණය විය.

### 3.2.2 සුලං මනින කුඹ 10 ක් (Wind Measuring Masts)සැපයීම, පිරි සැකසීම ,සවිකිරීම හා පැවරීම

මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් පහත දැක්වෙන දුර්වලතාවයන් 2014 මැයි මාසය අග වන විටත් නොවෙනස්ව පැවතුණි.

(අ) සුලං මනින දත්ත රැස් කිරීම පිළිබඳව භෞතික කාර්ය සාධනය සියයට 51 ක මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. එබැවින් සුළං මනින කුඹ ස්ථාපිත කිරීම සඳහා ස්ථාන හඳුනා ගැනීම, සුළං මැනීමේ දත්ත රැස් කිරීම හා එම දත්ත වාර්තාකරණය ආදී අපේක්ෂිත අරමුණු සුළං මනින කුඹ ස්ථාපිත කිරීම මඟින් ඉටුකර ගැනීමට අධිකාරියට නොහැකි වී තිබුණි.

(ආ) නාවුකුඩා හි සවි කරන ලද කුළුණ අවශ්‍ය ප්‍රමිතියට නොමැති වීම නිසා දරන ලද රු.2,377,000 ක පිරිවැය ඵල රහිත වියදමක් බවට පත්ව තිබුණු බව නිරීක්ෂණය විය.

### 3.2.3 "ස්විච් -ඒෂියා"වැඩ සටහන (switch –Asia programme)

මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වාදෙන ලද පරිදි "ස්විච් -ඒෂියා"වැඩ සටහන යටතේ ලැබුණු රු.7,334,354 ක මුදලින් රු.3,135,202 ක මුදලක්, 1994 ජූනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ හා 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ/5 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව 2010 හා 2011 වර්ෂ තුලදී අධිකාරියේ සියළු නිලධාරීන් සඳහා වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණි.

මෙම ගෙවීම සියළුම නිලධාරීන්ගෙන් හෝ අධිකාරියේ සභාපතිගෙන් අයකර ගැනීමට , විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් ඔහුගේ 2012 දෙසැම්බර් 03 දිනැති අංක පීඊ/අයිඑ/22/vol-II දරන ලිපියෙන් අධිකාරියේ සභාපති වෙත උපදෙස් දී තිබුණි. කෙසේ වුවද මෙම බලය නොලත් ගෙවීම් අයකර ගැනීම සඳහා විගණන පරීක්ෂණ දිනය වන 2014 මැයි 26 දක්වා අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 3.3 මානව සම්පත් කළමනාකරණය (HRM)

අධිකාරියේ විධිමත් කාර්ය මණ්ඩල කළමනාකරණයක් ක්‍රියාත්මක නොවූ අතර අධිකාරියේ වර්තමාන බඳවා ගැනීම් පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණි.

## 3.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

--------------------------------------

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදලේ හා ශ්‍රී ලංකා සුනිත්‍ය සහතික අරමුදලේ ආයෝජනයන්ගෙන් 2008 සිට 2012 කාල පරිච්ඡේදය දක්වා ලැබී තිබුණු රු. 39,618,010 ක් වූ පොළී ආදායම අදාළ අරමුදල්වලට ප්‍රේෂණය කිරීමෙන් තොරව අධිකාරිය විසින් උපයෝජනය කර තිබුණි.

## 3.5 අධිකාරී බලය නොමැති ගෙවීම්

--------------------------------------

අධිකාරිය විසින් සේවකයින්ගේ ලබා නොගත් නිවාඩු සඳහා වූ රු 1,038,866 ක මුදල, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමේ විධිමත් අනුමැතියෙන් තොරව මුදල් කර තිබුණි.

## 3.6 නිරවුල් නොකළ විදේශ ගමන් අත්තිකාරම්

------------------------------------------------------

අධිකාරියේ අධ්‍යක්ෂවරයෙකු විසින් විදේශ පුහුණු වැඩ සටහනකට සහභාගි වීම සඳහා උණුසුම් ඇඳුම් මිලට ගැනීම සඳහා අත්තිකාරම් වශයෙන් රු.15,880 ක් සහ රු.116,991 ක් දෙවතාවකදී ලබාගෙන තිබුණි. කෙසේ වුවද විගණන දිනය වූ 2014 මැයි 26 දින වන විටත් එකී අත්තිකාරම් පියවා නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------------

## 4.1 අයවැය ලේඛනමය පාලනය

-----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

- (අ) අයවැය පාලනය
- (ආ) වත්කම් කළමනාකරණය
- (ඇ) ගිණුම්කරණය
- (ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- (ඉ) මානව සම්පත් කළමනාකරණය
- (ඊ) ගෙවීම් පරිපාටිය